## කාර්යක්ෂමතා කඩඉම් විභාග
## අයදුම්පත් මාර්ගගතව සම්පූර්ණ කිරීම සඳහා පොදු උපදෙස්

**<u>(අ) පොදු උපදෙස්:</u>**

1. මාර්ගගත (online) අයදුම්පත **<u>ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක්</u>** සම්පූර්ණ කළ යුතු අතර, මෙම උපදෙස් පත්‍රිකාව අවසානයේ ඇති **<u>ඇමුණුමේ ආකෘතිය</u>** අනුව සම්පූර්ණ කළ යුතුය.
2. අයදුම්කරු විසින් මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කරනු ලබන ජංගම දුරකථන අංකය වෙත විභාගය සම්බන්ධව සිදුකරනු ලබන සියලුම දැනුම්දීම් SMS මඟින් එවනු ලබන බැවින්, අයදුම්කරු වෙත එම තොරතුරු ලබා ගත හැකි ජංගම දුරකථන අංකයක් යෙදිය යුතු වේ.
3. **එක් අයදුම්කරුවකු හට එවිය හැකි වන්නේ එක් අයදුම්පතක් පමණි.** මාර්ගගත පද්ධතියට ප්‍රවේශවීම (Login) සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කරන්න. අන් අයගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කිරීමෙන් වළකින්න.
4. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන " " ?: { }[ ]'!`~#$%^* <> = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අර්ධ වශයෙන් යොමු වීම හෝ ප්‍රතික්ෂේප වීම මත සිදුවන අපහසුතා අයදුම්කරු විසින් දරාගත යුතු වේ.
5. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
   i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Bank Debit Card with internet payment facility)
   iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking method of Bank of Ceylon)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

   (ලංකා බැංකු ශාඛාවක් මඟින් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් ගෙවීම සිදු කිරීමට අදාළව ඔබට අනන්‍යව E***** ලෙස ලැබෙන යොමු අංකය (Reference No.) අනිවාර්යයෙන් යෙදිය යුතුය.)
6. ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා **(ආ) තාක්ෂණික උපදෙස්** බලන්න. **අයදුම්කරුවන් හට මුදල් ගෙවීමේ ක්‍රමවේද (Payment Method) වෙනස් කළ හැක්කේ එක් වරක් පමණි.**
7. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.
8. **සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේ දැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. (පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)** අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීති රීතිවලට එකඟ වන බව තහවුරු කළ යුතුය.

9. **ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.**

10. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් (printout) ලබාගෙන අත්සන සහතික කිරීමෙන් අනතුරුව **ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල" යන ලිපිනයට එවිය යුතුය. පසුව කරනු ලබන විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය.**

11. මාර්ගගත අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.
    a. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    b. මුදල් නොගෙවන ලද අයදුම්පත් (පළමුවන වරට අයදුම්කරන නිලධාරීන් හැර) ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. තැපැල මඟින් එවනු ලබන අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

13. **විමසීම් කිරීම - කාර්යාලීය වේලාවන් තුළදී පමණි.**
    - විභාගයට අදාළ කරුණු පිළිබඳව - ගැසට් පත්‍රයේ/ විභාග නිවේදනයේ සඳහන් වන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව මඟින්
    - විභාග අයදුම්පත් යොමු කිරීමේදී ඇති වන සාමාන්‍ය ගැටලු පිළිබඳව (ආයතනික විභාග සංවිධාන ශාඛාව) - 011-3661244
    - විභාග අයදුම්පත් යොමු කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටලු පිළිබඳව (පරිගණක ශාඛාව) - 011-2784226
    - ලංකා බැංකු ශාඛා මඟින් ගෙවීම් පිළිබඳව - 1975

14. අයදුම්පත් මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.

15. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

16. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.


**<u>(ආ) තාක්ෂණික උපදෙස්:</u>**

1. **පද්ධතියට ප්‍රවේශ වීම**

    i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න (www.doenets.lk).


    ii. එහි අපගේ සේවා (Our Services) යටතේ ඇති “**Online Applications (EB/Recruitment Exams)** ” මුහුණත (Tile) මත Click කරන්න.

    iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




    iv. එහි ඇති “**Apply for Exams**” මඟින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.

2. “Apply for Exams”





i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.


ii. යම් අවස්ථාවන්හිදී එකම ආයතනයක් විසින් අයදුම්පත් කැඳවනු ලබන විභාග කිහිපයක් තිබිය හැකි බැවින්, අයදුම්පත් යොමු කිරීමට බලාපොරොත්තුවන විභාගය අවධානයෙන් යුතුව තෝරා ගත යුතු වේ. අයදුම් කිරීමෙන් පසුව විභාග මාරු කිරීම සිදුකල නොහැක.

iii. එහිදී විභාගය සම්බන්ධ ගැසට්/විභාග නිවේදනය හා උපදෙස් පත්‍රිකාව බාගත කළ හැක.

➢ **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර **එහි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ.** එයට අමතරව තම ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර **“I Agree with the Terms and Conditions”** “√” කර **reCAPTCHA** “√” කර **“Next”** Click කරන්න.



➢ ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මගින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර "**Submit**" click කරන්න.




3. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු

අයදුම්කරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.




- "**Save**" - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ.
- අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට "Submit this application" click කළ යුතුය.
- ඔබ විසින් "**Submit this application**" click කිරීම සහ ඉන්පසු සිදුකල යුතු ඉදිරි ක්‍රියාවලිය සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

- **“Submit this application”** click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).

Personal Information

| | |
|---|---|
| Select the relevant title | -- |
| Name in Full (IN BLOCK CAPITAL LETTERS) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Postal Address (IN BLOCK CAPITAL LETTERS) | 254/2, PELAWATTA, BATTARAMULLA. |
| Contact Number (Mobile)(For the future communication through SMS) | 0712874125 |
| Contact Number (Residence) | 0112478452 |
| Email Address | test@gmail.com |
| Gender | Male |
| Date of Birth | 02 Jun 1992 |
| Are you a citizen of Sri Lanka? | Yes |

Educational Qualifications (English Language)

| | |
|---|---|
| Do you possess a Credit pass in English Language at the G.C.E. (O/L) or N.C.G.E. or S.S.C. or international GCSE Examination? | Yes |
| Grade obtained | C |
| Name of the examination | G.C.E.(O/L) Examination |
| Name of the Dept./ Institution | Department of Examinations |
| Year | 2003 |

- යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (Edit) කළ යුතු නම්, Edit and Submit මඟින් නැවත අයදුම්පත වෙත ගොස් ( ← ) , සංශෝධනය (Edit) කර, “Submit this application” click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

- ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.

Certification of the Applicant

Attestation of Signature

Certificate of the Head of the Department

☑ I hereby confirm that the information provided here is accurate, correct and complete.


Only the first time candidates should click on "First time (Toll free)" below. All other applicants should click on "Pay for Subjects".

First time (Toll free) | Pay for Subjects

* Payment for the subjects should be made as per the gazette notification.

ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නම් “ First Time (Toll Free)” click කර ඉදිරියට ගොස් අයදුම්පත බාගත කර මුද්‍රණය කරගන්න.

ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් “ Pay for Subjects” click කරන්න. එවිට පහත පරිදි තිරයක් දිස්වේ.





මෙහිදී ඔබට අනිවාර්යයෙන්ම ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ඔබ විභාගයට පෙනී සිටින විෂයයන් සංඛ්‍යාව “**Enter the number of subjects to be paid in this box**” යනුවෙන් සඳහන් කොටුව තුළ ඇතුළත් කරන්න. ඇතුළත් කළ විෂයයන් සංඛ්‍යාව නිවැරදි නම් ඉහත රූපයේ පරිදි √ ලකුණ යොදා එකඟතාව පළ කර “**Proceed to payments**” click කිරීමෙන් මාර්ගගතව විභාග අයදුම්පත් සඳහා මුදල් ගෙවීමේ පිටුවට යොමු වේ.

2. **විභාග ගාස්තු ගෙවීම**

**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය (Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**


පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.




➢ **Pay with Credit/Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.

- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/Debit** කාඩ්පත අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු **Credit/Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/Debit**කාඩ්පත් මඟින් ගෙවීම් කළ නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.





➢ **Pay with BOC** ක්‍රමවේදය

“**Pay with BOC**” මඟින් මුදල් ගෙවීමේදී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන **ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමවේදයෙන් (B App මඟින් හෝ Flex App)** හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය.


**විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට සෘජුවම Slip මඟින් ගෙවීම් නොකළ යුතුය.**

නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ වන (**Our Services**) යටතේ ඇති “**Online Applications (Recruitment Exams)**” මුහුණත (Tile) මත Click කර හෝ https://applications.doenets.lk වෙත පිවිස එහි “**Continue after payment**” Click කරන්න. ඉන්පසු ඔබේ යොමු අංකය (Reference Number) ඇතුළත් කර ඉදිරියට යන්න.


සැ.යු: “**Pay with BOC**” **මඟින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු. 20.00 ක මුදලක් අයකරනු ලබයි.**




➢ මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති **"Continue after Payment"** click කරන්න.




➢ ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





➢ ඉහත ක්‍රම මඟින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊමේල් ලිපිනයට ද යැවේ.




3. **අයදුම්පත මාර්ගගතව යොමු කිරීම**


මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට **(Terms and Conditions)** එකඟ වන බවට හා අයදුම්පත යොමු කිරීම තහවුරු කිරීම **(Confirm)** සිදුකළ යුතුය. ඉන්පසු **“Complete & Submit”** click කරන්න.




4. **අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Printout) ලබා ගැනීම**

පහත රූපයේ පරිදි **“Download my application”** click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කළ හැක. බාගත කළ පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර ආයතන ප්‍රධානිගේ සහතිකය සමඟ **“ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල”** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන විභාගයේ නම නිවැරදිව සඳහන් කළ යුතුය.




## 5. මාර්ගගත අයදුම්පත ලද බව දැන්වීම

අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු අයදුම්පත දෙපාර්තමේන්තු පද්ධතිය මඟින් තහවුරු කළ පසු අයදුම්පත ලද බව SMS මඟින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (2026)**

**මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා විශේෂ උපදෙස්**

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේදී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

1) සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය, නගරය, විෂයයන් සඳහන් කරන්න.

## Medium, Town, Subject

* Medium of examination

○ Sinhala ◉ Tamil ○ English

* City & City No.

08-Matara

* Subjects you offer

- [x] 01-Office Systems
- [x] 02-Accounting Systems
- [x] 03-Computer Test

2) පෞද්ගලික තොරතුරු අදාළ පරිදි ඇතුළත් කරන්න.

## Personal Information

* Name in Full (IN BLOCK CAPITAL LETTERS)

HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

(E.g. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA) Max Length : 90

* Name with Initials at the end Full (IN BLOCK CAPITAL LETTERS)

GUNAWARDHANA, H.M.S.K

(E.g. : GUNAWARDHANA, H.M.S.K) Max Length : 90

* Name & Address of the Office/Department/Institution (IN BLOCK CAPITAL LETTERS)

SOUTHERN PROVINCIAL COUNCIL, GALLE

E.g: SOUTHERN PROVINCIAL COUNCIL, GALLE Max Length : 90

* Address to which the admission card should be sent (IN BLOCK CAPITAL LETTERS)

254/2,PELAWATTA

(Eg: 254/2,PELAWATTA) Max Length : 120

* Postal Town (IN BLOCK CAPITAL LETTERS)

BATTARAMULLA

(E.g: BATTARAMULLA) Max Length : 30

* Gender

Male

* Mobile Phone No.

5555555555

Max Length : 10

3) සේවා තොරතුරු හා අදාළ විෂයයන් නිසි පරිදි ඇතුළත් කරන්න.

## Present Post

* Post

DEVELOPMENT OFFICER GRADE III

* Number of the letter of appointment

TEST/01/TEST/TEST

* Date of entry into Grade III of Development Offi...

7/10/2018

(Date of entry into Grade III of Development Officers' service )

4) විභාගයට පෙනී සිටින්නේ කීවෙනි වරට ද යන්න සඳහන් කරන්න.

## Attempt

* Are you sitting the examination for the first time ?

Yes

5) විශේෂ අවශ්‍යතා ඇත්තේ නම් ඒ බව සඳහන් කරන්න.

## Statement

* Are you a Candidate with Special Needs ?

No

* If yes, give details below

NO

Max Length : 120

* මුද්‍රිත පිටපත ලබා ගැනීමෙන් පසු අනු අංක (6) සිට (9) හි අත්සන හා අවශ්‍ය තොරතුරු අත් අකුරින් පිරවිය යුතුය.

(Please print the application form and fill the following details by hand.)

6) **අයදුම්කරුගේ ප්‍රකාශය (Certificate of the Candidate)**

මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ අයදුම්කරු විසින් තම අත්සන යෙදිය යුතුයි.

| (6). Certificate of the Candidate |
|---|
| I declare that the information furnished above is correct and I am eligible to sit for the examination in the language medium mentioned above and it is not necessary to pay the examination fee since I am sitting for the examination for the first time/ I have paid the examination fee. I hereby agree to abide by the rules and regulations imposed by the Commissioner General of Examinations for the purpose of making the decision on conducting the examination and issuing the results and all the provisions of the Examinations Act. |
| Signature of candidate : ............................................................................ |
| Date: ............................................................................................ |
| Note : The candidate should sign in the presence of the Head of his/ her Department/ Institution or an officer authorized to sign on behalf of such Head of Department. |

7) **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

පුද්ගලික ලිපිගොනුව හරහා සත්‍යාපනය කළ යුතුය.

| (7). Certificate of the Head of the Department (To be verified through Personal file) |
|---|
| The foregoing details were verified through Personal file. Forwarded for certification, please. |
| Signature of Officer in Charge of Personal files: ..................................................................... |
| Date: ........................................................................................................................ |

8) අත්සන සහතික කිරීම

**(8). Attestation of the Signature**

I certify that Mr./ Mrs./ Miss .............................. who is an employee of my office and who is personally known to me placed his/ her signature to my presence on ........................ since he/ she is sitting for this examination for the first time it is advisable to exempt him/ her from the examination fee / has paid the examination fee.

Signature of the Person Attesting: ....................................................................................

Name :
..........................................................................................................................................

Designation : ..........................................................................................................................

Address : ..............................................................................................................................

Date : ....................................................................................................................................

(Official Stamp)

9) ආයතන ප්‍රධානියාගේ සහතික කිරීම

**(9). Certificate of the Head of the Department**

I certify that,

I. The particulars furnished by the candidate have been examined;

II. This officer belongs to Southern Provincial Public Services;

III. The officer has *appeared/not appeared for the examination earlier;

IV. *He/she has affixed the receipt obtained by paying the relevant fee to this application form since *he/she has appeared for the examination and;

V. The candidate is eligible to sit the examination.

*(Delete inapplicable words)

Signature of the Head of the Department: ...............................................................................

Name : ...............................................................................................

Designation : ...................................................................................................

Address :...................................................................................................

Date :...................................................................................................

(Official Stamp)

මුද්‍රිත පිටපතෙහි අදාළ ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම අත්සන යෙදිය යුතුයි.
සැ.යු. - අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

- මුද්‍රිත පිටපත ලබාගත් පසු මුදල් ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි දිස් වේ.

| *Official use only* | |
|---|---|
| **Payment Information** | |
| NIC | 444444444444 |
| Application Reference | E527ED |
| Payment Date and Time | 01-01-1970 05:30:00 |
| Exam Applied | EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE III OF DEVELOPMENT OFFICERS SERVICE OF THE SOUTHERN PROVINCE – 2025 (2026) |
| Exam Fee | 0.00 LKR |
| Total fee Paid | 0.00 LKR |